# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 2046 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 30/07/2024<br>පැය 0550 |

# මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

## 01. නිවසක් ගිනි ගෙන පුද්ගලයෙකු මියයාමක් - වත්තල පොලිස් වසම.

2024.07.29 වන දින රාත්‍රි කාලයේ වත්තල පොලිස් වසමේ මාටාගොඩ ප්‍රදේශයේ නිවසක හදිසි ගින්නක් හට ගෙන ඇති බවට 119 තොරතුරු මධ්‍යස්ථානයෙන් ලද පණිවිඩයක් මත වහාම ක්‍රියාත්මක වූ පොලිස් නිලධාරීන් ප්‍රදේශවාසීන්ගේ සහාය ඇතිව ගින්න මැඩ පවත්වා ඇත. ගින්න හේතුවෙන් තෙමහල් නිවසේ දෙවන මහලේ කාමරයක් තුල සිටි පුද්ගලයෙකු පිළිස්සුම් තුවාල ලබා නිවස තුලම මියගොස් සිට ඇත.

**මරණකරු වයස අවුරුදු 90 ක් වූ මාටාගොඩ, හැදල, වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු පමණක් නිවසේ සිට ඇති අතර, බිරිඳ දින කිහිපයකට පෙර රත්නපුර ප්‍රදේශයේ දියණියගේ නිවස වෙත ගොස් සිට ඇත. මෘත ශරීරය පොලිස් ආරක්ෂාව යටතේ සිද්ධිය වූ ස්ථානයේ ඇත. ගින්න ඇති වීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. වත්තල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**02.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවකු අත්අඩංගුවට - කැලණිය පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.**

2024.07.29 වන දින දහවල් කාලයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ සේදවත්ත පාර ප්‍රදේශයේදී බස්නාහිර පළාත් බුද්ධි නිලධාරීන්ගෙන් ලද තොරතුරක් මත කැලණිය පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් මෝදර පොලිස් ස්ථානයේ නිලධාරීන් හා එක්ව වෙළඳසැලක් තුල සිදුකළ වැටලීමක දී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 426 මිලිග්‍රෑම් 700 ක් සහ මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන මුදල් රුපියල් 185,000/- ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 60 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03.** **ගංජා හේනක් වටලා සැකකරුවන් දෙදෙනෙකු ගිනි අවි 02 ක් සමඟ අත්අඩංගුවට - බුත්තල පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.**

බුත්තල පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් යාල රක්ෂිතයේ දින 03 ක් පුරා සිදුකළ මෙහෙයුම් රාජකාරියකින් අනතුරුව 2024.07.28 වන දින සවස් කාලයේ කලාප අංක 04 ප්‍රදේශයේ අක්කරයක පමණ **ගංජා හේනක් වටලා සැකකරුවන් දෙදෙනෙකු විදේශ රටක නිෂ්පාදිත බෝර 12 වර්ගයේ ගිනි අවියක්, බෝර 12 පතරොම් 03 ක් සහ මෙරට නිෂ්පාදිත අවියක් සමඟ** අත්අඩංගුවට ගෙන 2024.07.29 වන දින ගෝනගංආර පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත. නිලධාරීන් විසින් ගංජා හේන විනාශ කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21 හා 30 වයස්වල පසුවන බුත්තල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ගෝනගංආර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවකු අත්අඩංගුවට - කළුතර අපරාධ කොට්ඨාසය.**

2024.07.29 වන දින සවස් කාලයේදී කළුතර උතුර පොලිස් වසමේ මුහුදු වෙරළ පාරේදී කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 20 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන කළුතර උතුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 59 ක් වන කළුතර උතුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කළුතර උතුර පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය**

2024.07.29 වන දින දහවල් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ස්ටේස් පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 08 මිලි ග්‍රෑම් 500 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. හෙරොයින් සමග සැකකරුවකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.07.29 වන දින දහවල් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ කටුකුරුඳුවත්ත පාර ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 55 ක් වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**07. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - නෝර්වුඩ් පොලිස් ස්ථානය.**

2024.07.29 වන දින උදෑසන කාලයේ නෝර්වුඩ් පොලිස් වසමේ බාත්බෝඩ් වත්ත ප්‍රදේශයේ දී නෝර්වුඩ් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු මැණික් ගැරීමට යොදා ගත් උපකරණ සමග අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 32 හා 49 වයස්වල පසුවන බගවන්තලාව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

නෝර්වුඩ් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. බඹර ප්‍රහාරයක් - ඇටැම්පිටිය පොලිස් වසම.**

2024.07.29 වන දින සවස් කාලයේ ඇටැම්පිටිය පොලිස් වසමේ ඇටම්පිටිය වත්ත ප්‍රදේශයේදී පුද්ගලයන් පිරිසක් බඹර ප්‍රහාරයකට ලක්ව ඇති බවට ඇටම්පිටිය පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**පිරිමි පුද්ගලයන් 04 දෙනෙකු සහ කාන්තාවන් 08 දෙනෙකු බඹර ප්‍රහාරය හේතුවෙන් තුවාල ලබා ඇටම්පිටිය රෝහල වෙත ඇතුලත් කර ඇත. මොවුන් ඇටම්පිටිය වත්ත ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

උකුස්සන් විසින් බඹර කූඩුව කැඩීමෙන් බඹරුන් ඇවිස්සීමෙන් මෙම අනතුර සිදුව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. ඇටම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 09. තියුණු ආයුධයකින් පහරදී බරපතුල තුවාල කිරීම - කඩවත පොලිස් වසම.

2024.07.29 වන දින සවස් කාලයේ කඩවත පොලිස් වසමේ ඉහල බියන්විල ප්‍රදේශයේ ගරාජයක් පවත්වාගෙන යනු ලැබූ පුද්ගලයෙකුට ගෙල ප්‍රදේශයට තියුණු ආයුධයකින් පහරදී බරපතල තුවාල සිදුකර ඇති බවට කඩවත පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත. තුවාලකරු ප්‍රතිකාර සඳහා රාගම රෝහල වෙත ඇතුලත් කර ඇත.

**තුවාලකරු මාවරමණ්ඩිය, කඩවත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මුදල් ආරවුලක් මත මෙම පහරදීම සිදුකර ඇති බවට පොලිසිය සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. පහරදීම සිදුකළ සැකකරු ප්‍රදේශයෙන් පලා ගොස් ඇත. සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා කඩවත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 10. ගිනි අවියක් පත්තුවී දැරියක් තුවාල වීම - මකුළුගස්වැව පොලිස් වසම.

2024.07.29 වන දින සවස් කාලයේ මකුළුගස්වැව පොලිස් වසමේ දේවහුය ප්‍රදේශයේ නිවසක් තුල මෙරට නිෂ්පාදිත ගිනි අවියක් පත්තු වීමෙන් තුවාල ලැබූ දැරියක් ප්‍රතිකාර සඳහා දඹුල්ල රෝහලට ඇතුලත් කර ඇති බවට මකුළුගස්වැව පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**තුවාල ලැබූ දැරිය වයස අවුරුදු 07 ක් වන දේවහුය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෙම ගිනි අවියන නිවස තුල තිබියදී නිවස අස් කිරීමේදී ගිනි අවිය බිම වැටී පත්තුවීමෙන් මෙම අනතුර සිදුව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. මකුළුගස්වැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. නාඳුනන මළ සිරුරක් - පයාගල පොලිස් වසම.

2024.07.29 වන දින දහවල් කාලයේ පයාගල පොලිස් වසමේ පඹේ ප්‍රදේශයේ වගුරු බිමක නාඳුනන මළ සිරුරක් ඇති බවට ලද පණිවිඩයකට අනුව පයාගල පොලිසිය මගින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර කළුතර නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මෘත ශරීරය සතුන් විසින් කාදමා ඇති අතර, හඳුනා ගත නොහැකි තත්ත්වයේ පවතී. පයාගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - උප්පුවේලි පොලිස් වසම.

2024.07.29 වන දින දහවල් කාලයේ උප්පුවේලි පොලිස් වසමේ ත්‍රිකුණාමලය පුත්තලම මාර්ගයේ කිලිකුංචිමලේ හන්දියේ දී අනුරාධපුරය සිට ත්‍රිකුණාමලය දෙසට ධාවනයවූ යතුරු පැදියක් එම දිශාවටම ධාවනයවූ කුඩා ලොරි රථයක පිටුපස ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු බරපතල තුවාල ලබා ත්‍රිකුණාමලය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 39 ක් වන හුරුළුනිකවැව, ගලෙන්බිඳුණුවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ත්‍රිකුණාමලය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. උප්පුවේලි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 13. මාරක රිය අනතුරක් - වැලිපැන්න පොලිස් වසම.

2024.07.29 වන දින සවස් කාලයේ වැලිපැන්න පොලිස් වසමේ අළුත්ගම මතුගම මාර්ගයේ ලේව්වන්දූව හන්දියේ දී මතුගම සිට අළුත්ගම දෙසට ධාවනයවූ ලොරි රථයක මාර්ගය හරහා ගමන්කළ පදික කාන්තාවක් ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් කාන්තාව බරපතල තුවාල ලබා වෑත්තෑව රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කළුතර නාගොඩ රෝහලට මාරු කර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 62 ක් වන අස්වැලිය වත්ත, බදුරලිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වැලිපැන්න පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 14. මාරක රිය අනතුරක් - කෑගල්ල පොලිස් වසම.

2024.07.29 වන දින සවස් කාලයේ කෑගල්ල පොලිස් වසමේ මහනුවර කොළඹ මාර්ගයේ බල්ලපාන ප්‍රදේශයේ දී කොළඹ සිට මහනුවර දෙසට ධාවනයවූ යුධ හමුදා ලොරි රථයක මාර්ගය හරහා ධාවනය කළ යතුරු පැදියක් ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු බරපතල තුවාල ලබා කෑගල්ල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 66 ක් වන පාතබාගේ, ගලිගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කෑගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කෑගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 15. මාරක රිය අනතුරක් - මීටියාගොඩ පොලිස් වසම.

2024.07.29 වන දින සවස් කාලයේ මීටියාගොඩ පොලිස් වසමේ ගාල්ල කොළඹ මාර්ගයේ වැරැල්ලාන ප්‍රදේශයේදී හික්කඩුව සිට අම්බලන්ගොඩ දෙසට ධාවනයවූ ත්‍රීරෝද රථයක මාර්ගය හරහා ගමන්කළ පදික පුද්ගලයෙකු ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික පුද්ගලයා බරපතල තුවාල ලබා බලපිටිය රෝහලට ඇතුලත් කර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 78 ක් වන කළුපේ, හික්කඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය බලපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ත්‍රීරෝද රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මීටියාගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**